# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 12,177—1960 අගෝස්තු 5 වැනි සිකුරාදා — 5.8.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන

අ. ආ. කා. අංකය : C 243/60.

ශ්‍රී ලංකාද්වීපයේ සහ සවකීය අනිකුත් විජිතයන්හි හා යටත් ප්‍රදේශයන්හි අග රජිනවූද, පොදු රාජ්‍ය මණ්ඩලයෙහි අධිපතිනියවූද, නෛකශ්‍රීන් විරාජමාන දෙවැනි එලිසබත් මහා රාජිනියගේ ශ්‍රී නාමයෙනි.

### ප්‍රකාශනය

අති සම්භාවනීය ශාන්ත මයිකල් හා ශාන්ත ජෝර්ජ් සමයානුගත උත්තම කුරුසියේ නයිට් පදවිය, රාජකීය වික්ටෝරියානු ශ්‍රේණිගත නයිට් විධායක පදවිය හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අති උත්තම විධායක නයිට් පදවිධාරිවූ, ශ්‍රී ලංකාද්වීපයෙහි හා තදීය යටත් ප්‍රදේශවල අග්‍රාණ්ඩුකාර හා සේනාධිපති ධුරන්දර ශ්‍රීමත් ඔලිවර් අර්නස්ට් ගුණතිලක උතුමාණන් වහන්සේ විසිනි.

(මුද්‍රාව)

ඔ. ඊ. ගුණතිලක.

වර්ෂ 1960 ක්වූ අප්‍රේල් විසිතුන් වැනි දින දරණ මගේ ප්‍රකාශනයෙන්, වර්ෂ 1960 ක්වූ අගෝස්තු පස් වැනි සිකුරාද රැස්වන ලෙස අලුත් පාර්ලිමේන්තුවක් මා කැඳවා ඇති හෙයින්ද,

එකී පාර්ලිමේන්තුව කැඳවීමේ හේතු ප්‍රකාශ කිරීමට මා කැමතිවන හෙයින්ද,

වර්ෂ 1960 ක්වූ අගෝස්තු දොළොස් වැනි සිකුරාද පූර්ව භාග 10.15 ට කොළඹ, ටොරින්ටන් චතුරශ්‍රයේ නිදහස් අනුස්මරණ මන්දිරයේදී, එකී පාර්ලිමේන්තුව කැඳවීමේ හේතු මා විසින් ප්‍රකාශ කරන වග මෙයින් දනගත යුතුයි.

වර්ෂ එක්වාදහස් නවසිය හැටක්වූ අගෝස්තු පස් වැනිද වන මෙදින කොළඹදී අත්සන් කොට දෙන ලදී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

819—ජේ. ඇන්. ආර් 11127—4,060 (8/60)